# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1841/23 - 2013 දෙසැම්බර් මස 20 වැනි සිකුරාදා - 2013.12.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත**

52 වැනි වගන්තිය යටතේ වූ නියමය

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 52 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සහ විදුලිබල සහ බලශක්ති විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශ මත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම,

(අ) මෙහි උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ඉඩම, විදුලිබල සම්ප්‍රේෂණ ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා වහාම අවශ්‍ය වන බව ; සහ

(ආ) එකී විදුලිබල සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය, මහජන කාර්යයක් වන බැවින් මහජනතාවගේ පොදු සුභ සාධනය සහ ප්‍රතිලාභය සඳහා ඉවහල් වන බව

අදහස් කරන හෙයින්, එකී ඉඩම එම කාර්යය සඳහා අවශ්‍ය වන බවට මෙම නියෝගයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 දෙසැම්බර් මස 18 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

**උපලේඛනය**

**ඉඩමේ මායිම්**

ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ, නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මිල්ලගහමුල (වසම අංක 316E) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පිටවල ග්‍රාමයේ පිහිටියා වූ ද, බලයලත් මිනින්දෝරු නිමල් ලියනගේ විසින් මැන සාදන ලද 2013.09.10 දිනැති අංක 1066 දරන මානක සැලැස්මේ නිරූපණය කර ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 15ක් වූ ඉඩමට මායිම් පහත දැක්වෙන පරිදි වේ :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | දෙල්පත් ඔය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | පාර සහ නිල නිවාස භූමිය ; |
| *බස්නාහිරට* | : | පාර සහ නිල නිවාස භූමිය. |
| *ප්‍රමාණය* | : | අක්කර 15යි |
| *හිමිකම් කියනු ලබනුයේ* | : | තෝමස් ජයසිංහ සහ තවත් අය |

01-228


1A - G 018763 — 200 (2013/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*